UPDF
WWW.UPDF.COM

ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : தேசிய விலங்கியல் தோட்டங்கள் துறை

நிலையியற் கட்டளையின் இலக்கம் 119 (4) இன்படி விதிமுறைகளில் பொது கணக்கு குழுவினால் வழங்கப்பட்ட அறிக்கைக்கு ஏற்ப எடுக்கப்பட்ட நடவடிக்கைகளும் மற்றும் கௌரவ அமைச்சர் அவர்களின் அவதானிப்புகளினதும் சமர்ப்பிப்பு

Name of the Institution: Department of National Zoological Gardens

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

UPDF
WWW.UPDF.COM

පාර්ලිමේන්තු සැසිවාර අංකය : 79

ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

	මූල්‍ය නීතිරීති හා කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගන්නා ලද දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ වර්තමාන තත්ත්වය
	පළමු කොටස	
01	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පාඩු ලේඛණය ආරම්භ කර, එය මේ වනවිට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
02.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2023 වර්ෂයේ සකස් කරන ලද අවදානම් ලේඛනය 2024 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇති අතර, එම යාවත්කාලීන කරන ලද අවදානම් ලේඛනය පදනම් කරගෙන 2024 වාර්ෂික විගණන සැලැස්ම 2023.12.14 දින දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමත කරගෙන එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවටද යොමුකර ඇති බව කාරුණිකව දන්වමි.
03	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු වෙනත් අංශ මගින් ලබාගෙන නැවත සකස් කර, විගණන අංශයට යොමුකළ යුතු බැවින්, මසක් තුළ පිළිතුරු යොමුකිරීමට නොහැකි අවස්ථා පැවතියද, 2023 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන විමසුම් මසක් තුළ යොමුකිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.
04	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අප දෙපාර්තමේන්තුව යටතේ උප ආයතන 04ක් ක්‍රියාත්මක වන බැවින්, නියමිත කාල රාමුව ඇතුළත මු.රෙ 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීමේදී සැලකිය යුතු කාලසීමාවක් ගතවන බැවින්, 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 වර්ෂය තුළ අවසන් කිරීමට කටයුතු කළ අතර, 2023 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය මේ වනවිට අවසන් අදියරේ කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.

UPDF
WWW.UPDF.COM

	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ හා අනෙකුත් නිර්දේශ 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සමඟ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.
05	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡනය පින්තාරු කළ විට වාහනයේ ආලේපිත පින්තාරුව විනාශවීමක් සිදුවන බැවින්, රාජ්‍ය ලාංඡනය Board 01ක් ආධාරයෙන් සකස් කර සියලු වාහනවල සවිකිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.
06	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ මැයි මස සිට බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
07	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ගිහි ණය ශේෂ පැවතුණි.	2023 වර්ෂයේ දී එම ගිහි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.
08	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ සියළුම තැන්පතු මේ වනවිට නිරවුල් කිරීමට කටයුතු කර ඇතිබව දන්වා සිටිමි.
09	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	• අනුමත තනතුරු සංඛ්‍යාව - 106 කි. • එක් නිලධාරියෙකු 2023.10.17 දින ක.සේ.නි. III තනතුරට මුදාහරින ලදී. • සෆාරි උද්‍යානයේ ක්ෂේත්‍ර සහායක චමින්ද රුවන් කුමාර මහතාට 2021.03.23 දින සිට තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර ඇත. • නියාන් ධනුෂික හෙට්ටිආරච්චි මහතාට 2021.09.13 දින සිට තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර ඇත. (2023.09.20 දිනැති ලිපිය මඟින්) • උක්ත නිලධාරීන් තිදෙනා කාර්ය මණ්ඩලයෙන් ඉවත් වුවහොත් අනුමත තනතුරු ගණන 106 ලෙස නිවැරදි වේ. • තවද ටී.ටී.ටී.ඉන්ද්‍රජිත් මහතා - ක්ෂේත්‍ර සහයක 2023.06.24 දින මියයාම මත වර්තමාන ක්ෂේත්‍ර සහායක සංඛ්‍යාව 105කි. • ක්ෂේත්‍ර සහයක - ටී.වාසනා හර්ෂණී මහත්මිය 2024.05.17 දින සේවයෙන් ඉල්ලා අස්විය.

UPDF
WWW.UPDF.COM

		• මේ වනවිට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහයකයින් 104ක් සේවය කරනු ලැබේ. • ඒ අනුව, ක්ෂේත්‍ර සහායක පුරප්පාඩු සංඛ්‍යාව 02කි.
	දෙවන කොටස	
01.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නිසා නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබා දීම සීමා කරන ලදී.
02.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී සකස් කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.

.....

ගුණදාස සමරසිංහ,
ලේකම්,
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

ගුණදාස සමරසිංහ
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය

.....

එම්.එස්.එල්.ආර්.පී.මාරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

එම්.එස්.එල්.ආර්.පී. මාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
දෙහිවල